# <u>ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස්</u>

**විෂයය** : සිංහල භාෂාව හා සාහිත්‍යය

**ශ්‍රේණිය** : 11

**වාරය** : දෙවන වාරය

**නිපුණතාව** : **2.0** ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : **2.3** නිශ්ශබ්ද ව කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.

**<u>ක්‍රියාකාරකම් 1</u>**

1) දිවයිනේ පිහිටුවන ලද පළමු විශ්වවිද්‍යාලය කුමක් ද ?
2) 1904 දී ලංකාවේ විශ්වවිද්‍යාලයක් පිහිටුවීම සඳහා ආරම්භ කළ සංගමය කුමක් ද ?
3) විශ්වවිද්‍යාල කොලීජිය මගින් ප්‍රථම වතාවට ඉගැන්වීම ආරම්භ කළ විෂය ධාරා නම් කරන්න.
4) අයිවර් ජෙනිංග්ස් ඉපදුණු වර්ෂය හා ස්ථානය කුමක් ද ?
5) එතුමා කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කළේ කුමන විශ්වවිද්‍යාලයේ ද ?
6) බැරිස්ටර් උපාධිය ලබා ගත් වසර හා විශ්ව විද්‍යාලය නම් කරන්න.
7) ස්වාධීන විශ්ව විද්‍යාල නීති සම්පාදනය කිරීමේ දී සංකේතාත්මක ව ඒ බව ජෙනිංග්ස් මහතා ප්‍රකාශ කළේ කෙසේ ද ?
8) ජාතික සම්ප්‍රදායට ගරු කිරීමට හා යුනිවර්සිටි කොලීජියේ ප්‍රධානාචාර්ය සිහි කිරීම සඳහා පේරාදෙණියේ ලංකා විශ්ව විද්‍යාලයේ නේවාසිකාගාර නම් කළේ කුමන නම්වලින් ද ?
9) අයිවර් ජෙනිංග්ස් මහතා ලෝකයා වෙත තිළිණ කළ ග්‍රන්ථ කිහිපයක් නම් කරන්න.
10) එතුමා මියගිය වර්ෂය කුමක් ද ?

11) ජෙනිංග්ස් මහතා ලියූ චරිතාපදානය නම් කළේ කුමන නමකින් ද ?

12) එතුමාට හිමි වූ ගෞරව සම්මාන මොනවා ද ?

**<u>ක්‍රියාකාරකම් 2</u>**

1) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද පහළින් දී ඇති කොටසින් තෝරා ලියන්න.

i. විවේකී -

ii. සංකෝචනය -

iii. පරාධීන -

iv. අවිශිෂ්ට -

v. දේශීය -

vi. බාහිර -

vii. අවිද්‍යාත්මක -

viii. අනපේක්ෂිත -

ix. පසුබස්නා -

x. අවමාන -

| | | | | |
|---|---|---|---|---|
| සම්මාන | ශිෂ්ට | අවිවේකී | විද්‍යාත්මක | ප්‍රසාරණය |
| අභ්‍යන්තර | නොපසුබස්නා | විදේශීය | අපේක්ෂිත | |
| ස්වාධීන | | | | |

2) පහත දී ඇති පදවල ප්‍රකෘති හා ප්‍රත්‍යය වෙන් කරන්න.

i. ගුරුන් -

ii. නිවසක් -

iii. සිසුන්ට -

iv. ආයතනයක් -

v. මිනිසෙකු -

vi. ගසින් -

vii. ගැහැනියක් -

viii. කොපුලතින් -

ix. පුටුවෙහි -

x. පාසලෙහි -

3) පහත දී ඇති පද සන්ධි කොට සන්ධි නාමය ලියන්න.

i. ගමන + ආගමන -

ii. හත් + අඩිය -

iii. සිවු + අඟ -

iv. කන් + මුල -

v. අර්ථ + අලංකාර -

vi. කෙළි + අට -

vii. ජාති + ආලය -

viii. ශිෂ්‍ය + උන්නතිය -

ix. අති + අලංකාර -

x. දකුණු + අතින් -

4) මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පද තෝරන්න.

i. **කෘදන්ත නාම** - ගයනු , ලියවිලි , නැටුම් , ගැමි

ii. **උපසර්ග** - අවගුණ , ප්‍රබල , මුදුනා , පිළිසරණ

iii. **තද්ධිත නාම** - මුහුළස් , සිරිමත් , ශිල්පී ,දෙව්දත්

iv. **නිපාත පද** - වැනි , සෙද , අහෝ , උගත්

v. **සර්ව නාම** - අප , ඔවුන් , කුමරු , මම

5) පහත දී ඇති ප්‍රකෘති ප්‍රත්‍යය ඇසුරින් තද්ධිත පද සාදන්න.

i. පුත් + අණු -

ii. උදාර + තර -

iii. චතුර + ය -

iv. පුද්ගල + ඉක -

v. රූ + මත් -

vi. ශෛල + මය -

vii. ඉන්දියා + නු -

viii. පොඩි + ඉති -

ix. රජ + ආණ -

x. නැමි + ආ -

6) දී ඇති උපසර්ග වචනවල යොදා වචන සාදන්න. ඒ ඇසුරින් වාක්‍ය සාදන්න.

i. පර

ii. අව

iii. දුශ්

iv. අති

v. පරි

vi. ස

vii. නිර්

viii. අධි

ix. උද්

x. නිශ්

**<u>පිළිතුරු</u>**

**<u>ක්‍රියාකාරකම් 1</u>**

1) .

i. ලංකා විශ්ව විද්‍යාලය
ii. ලංකා විශ්ව විද්‍යාල සංගමය
iii. ● ශාස්ත්‍ර (කලා) විෂයයන්
 ● විද්‍යා විෂයයන්
iv. 1903 උතුරු එංගලන්තයේ බ්‍රිස්ටල් නුවරදී
v. උතුරු එංගලන්තයේ ලීඩ්ස් විශ්ව විද්‍යාලයේ
vi. 1929 - කේම්බ්‍රිජ් සරසවියෙන්
vii. කොලේජ් හවුස් නම් ගොඩනැගිල්ලේ ඉහළ මාලයෙහි කොඩි ගසක ලංකා විශ්ව විද්‍යාල ධජය නැංවීමෙන්
viii. ● සංඝමිත්තා ශාලාව
 ● මාර්ස් ශාලාව ආදී ....
ix. ● නීතිය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
 ● කැබිනට් රාජ්‍ය පාලනය
 ● පාර්ලිමේන්තුව
 ● ආසියාවේ පොදු රාජ්‍ය මණ්ඩලය
 ● ස්වයං පාලනයට ප්‍රවේශය
x. 1965 දෙසැම්බර් 19
xi. පේරාදෙණියට මාවත
xii. සම්මාන ආචාර්ය උපාධි; නයිට් පදවිය

**<u>ක්‍රියාකාරකම් 2</u>**

1) .

i. අවිවේකී
ii. ප්‍රසාරණය
iii. ස්වාධීන
iv. විදේශීය
v. ශිෂ්ට
vi. අභ්‍යන්තර
vii. විද්‍යාත්මක
viii. අපේක්ෂිත
ix. නොපසුබස්නා
x. සම්මාන

2) .

i. ගුරු + උන්
ii. නිවස + අක්
iii. සිසු + අන්ට
iv. ආයතන + අක්
v. මිනිස් + එකු
vi. ගස් + ඉන්
vii. ගැහැනි + අක්
viii. කොපුල් + අතින්
ix. පුටු + එහි
x. පාසල් + එහි

3) .

i. ගමනාගමන (පූර්ව ස්වර ලෝප සන්ධිය)
ii. හත්තඩිය (ද්විත්ව සන්ධිය)
iii. සිවුරඟ (ආගම සන්ධිය)
iv. කම්මුල (පරරූප සන්ධිය)
v. අර්ථාලංකාර (ස්වරාදේශ සන්ධිය)
vi. කෙළියට (ආගම සන්ධිය)
vii. ජාත්‍යාලය (ස්වරාදේශ සන්ධිය)
viii. ශිෂ්‍යෝන්නතිය (ස්වරාදේශ සන්ධිය)
ix. අත්‍යාලංකාරය (ස්වරාදේශ සන්ධිය)
x. දකුණතින් (පූර්ව ස්වර ලෝප සන්ධිය)

4) .

i. ගැමි
ii. මුදුනා
iii. දෙව්දත්
iv. උගත්
v. කුමරු

5) .

i. පුතණු
ii. උදාරතර
iii. චාතුර්ය
iv. පෞද්ගලික
v. රූමත්
vi. ශෛලමය
vii. ඉන්දියානු
viii. පොඩිති
ix. රජාණ
x. නැමියා

6) .

i. අපි <u>පරගැති</u> සිරිත් ඉවතලමු.
ii. ගංවතුරින් <u>අවතැන්</u> වූවන්ට පිහිට විය යුතුය.
iii. ශාසනයෙහි <u>දුශ්ශීල</u> භික්ෂූන් නිසා සංගායනා පවත්වන ලදී.
iv. නැටුම් බැලීමට <u>අතිවිශාල</u> ජනතාවක් පැමිණ සිටියහ.
v. දැනුමින් <u>පරිණත</u> ගුරුවරු රැසක් අප පාසලේ සිටිති.
vi. වාක්‍ය <u>සදොස්</u> ය නිදොස් කරන්න.
vii. ළමා සිත් තුළ <u>නිර්මල</u> අදහස් රෝපණය කරමු.
viii. මිනිස්සු <u>අධිවේගී</u> මාර්ගවල සෙමින් යති.
ix. සිසුහු <u>උද්වේගයෙන්</u> කටයුතු කරති.
x. <u>නිශ්වල</u> දේපළ වෙනුවෙන් පිරිස නඩු කියති.